සැ. යු.- 2010.02.10 දින පළ වූ අංක 1,745 දරන ගැසට් පත්‍රයේ I-III, III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,746 - 2012 පෙබරවාරි 17 වැනි සිකුරාදා - 2012.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 86 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | 86 |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 87 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 88 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 පෙබරවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 පෙබරවාරි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තෙල්දෙණිය

2012 සංචාරක අධිකරණ සැසිවාර පවත්වන දිනයන්

මෙම අධිකරණය යටතේ පන්විල සංචාරක දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය 2012 වර්ෂයේ මෙහි පහත සඳහන් දිනවල පවත්වනු ලබන බව දන්වමි.

දිසා මහෙස්ත්‍රාත් - තෙල්දෙණිය.

2012 ජනවාරි මස 24 වැනි දින,
තෙල්දෙණිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *මාසය* | *දිනයන්* |
|---|---|
| ජනවාරි | 05, 12, 19, 26 |
| පෙබරවාරි | 02, 09, 16, 23 |
| මාර්තු | 01, 08, 15, 22, 29 |
| අප්‍රේල් | 05, 19, 26 |
| මැයි | 03, 10, 17, 24, 31 |
| ජූනි | 07, 14, 21, 28 |
| ජූලි | 05, 12, 19, 26 |
| අගෝස්තු | 02, 09, 23, 30 |
| සැප්තැම්බර් | 06, 13, 20, 27 |
| ඔක්තෝබර් | 04, 11, 18, 25 |
| නොවැම්බර් | 01, 08, 15, 22, 29 |
| දෙසැම්බර් | 06, 13, 20 |

02-473

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීම

**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

නඩු අංකය : 17475/එම්. බී.
ස්වභාවය : උකස්

මීගමුව දිසා අධිකරණ ඇස්කිසි අංක : 34/2011

කොළඹ 2, හයිඩ්පාක් කෝනර්, අංක 97 පෙර කොළඹ 1, ජනාධිපති මාවතේ, අංක 69, සෙලින්කෝ මන්දිරයේ, 3 වැනි මහලේ පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම.

........................................................................ පැමිණිලිකරු.

*එදිරිව*

නන්දසූරිය කුමාර පටබැඳිගේ දාමික සුජීව ප්‍රනාන්දු, අංක 250, උස්වත්ත, දැලතුර, ජාඇල

........................................................................ විත්තිකරු.

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුලත් කර ඇති වර්ෂ 2005.06.01 දිනැති තීන්දු ප්‍රකාශය මගින් ඉහත විත්තිකරුගෙන් පැමිණිලිකරුට රුපියල් හාරලක්ෂ පනස්හතර දහස් හාරසිය තිස්හයයි ශත හැට හතරක මුදලක් (රු. 4,54,436.64) වර්ෂ 2003.11.25 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වසරකට 21% බැගින් පොලිය ද, එතැන් සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් සමස්ථ මුදල සඳහා පොලිය ද, නඩු ගාස්තු ද ඒ සඳහා තවදුරටත් පොලිය හා ගාස්තු ද අයකර ගැනීමට පැමිණිලිකරු හට ආඥා කොට ඇති බැවින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කේ. පතිරාජ විසින් සහතික කළ වර්ෂ 2000.12.14 දිනැති අංක 3810 දරන බැඳුම්කරය පදනම් කරගෙන ඉහත කී රු. 4,54,436.64 ක මුදල හා වැඩිදුර පොලිය ද, නඩු ගාස්තු ද විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළ එකී ඉහත විස්තර කර ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම්, පරවශ්‍යතා සහ අනුබද්ධිතයින් ද, විත්තිකරුගෙන් කවර ආකාරයන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුලුවන්කාරකම් හිමිකම්පෑම සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙන් උපදන සහ එකතු වන සියලු කුලී ලාභ සහ අතිකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුලුව මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ

නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කිසි කළහැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ

වර්ෂ 2012 ක් වූ මාර්තු මස 15 වැනි දින ප. ව. 2.00ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ දෙල්තුනේ පිහිටි නාරිකුඹුර සහ දෙනිබිම නැමති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ජේ. ද සිල්වා විසින් වර්ෂ 1993.03.13 වැනි දින මැන සාදන ලද අංක 4608 දරන පිඹුරේ කැබලි අංක 1ඒ දරන කොටසට මායිම් උතුරට : මාර්ගය සහ ඩබ්ලිව්. කේ. පෙරේරා හට අයත් ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 1 බී ද, දකුණට : 1 බී සහ සංඛ පෙරේරා සහ එම්. එම්. නිමල් හට අයත් ඉඩම ද, බස්නාහිරට ඩබ්ලිව්. කේ. පෙරේරා හට අයත් ඉඩම යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම එකයි දෙකක් (අක්. 0, රූ. 0, පර්. 11.12) හෝ හෙක්ටයාර් 0.0281ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යන සියලුම දේ ද සමග වේ. මෙම ඉඩමට අදාළ සියලුම මාර්ග අයිතීන් ද සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 94/236 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර් - පිස්කල්,
දිසා අධිකරණය - මීගමුව.

වර්ෂ 2012 ක් වූ ජනවාරි මස 11 වැනි දින,
මීගමුව දිසා අධිකරණයේ දී ය.

02-631

---

# නොතාරිස් ලැයිස්තුව

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ.

01. දෙහිවල, ග්‍රෙගරි පාර, අංක 16 හි පදිංචි, පුෂ්ප රගිත සිරිවංශ මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. කොළඹ 15, සාන්ත මරියා පටුමග, අංක 6/1 හි පදිංචි, සෙන්දනායක ආරච්චිගේ දිල්ෂාරා චාමරි පෙරේරා මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. බෝගහකුඹුර, ඉඳුනිල හි පදිංචි, අබේරත්න ජයසුන්දර පණ්ඩිත හේරත් බණ්ඩාරනායක මුදියන්සේලාගේ රංජිත් සේනක බණ්ඩාර මහතා, බදුල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

04. මීගමුව, තලාදූව පාර, අංක 74/3 හි පදිංචි, රුවිනි වෙල්ගම මෙනෙවිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

05. බද්දේගම, සන්දරවල, රත්නගිරි මාවත, අංක 191ඒ හි පදිංචි, ගම්මුදුවත්තගේ ඉරෝෂි විජේවර්ධන මෙනෙවිය, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

06. වතුගෙදර, සීනිගොඩ, බෝධිය පාර, අංක 6/46 හි පදිංචි, ඉමේෂ් ලක්ෂිත ප්‍රසංග පතිරණ මහතා, බලපිටිය අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

07. චුන්නාකම්, දොස්තර සුබ්‍රමනියම් පාර, "මාරිය වාස" හි පදිංචි, ක්‍රිස්ටීන් රෝස් ඇන්ජලෝ ගනේස්වරන් මහත්මිය, යාපනය අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2012 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

02-501/1

---

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 04 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම කර තිබේ.

යාපනය, කොකුවිල්, කොකුවිල් නැගෙනහිර, අම්මාන් පන්සල පාර, අංක 44/2 හි ප්‍රධාන කාර්යාලය ද, යාපනය, කෙළින් වීදිය, අංක 134 (276) හි අතුරු කාර්යාලව ද සහිතව, යාපනය, කොකුවිල්, කොකුවිල් නැගෙනහිර, අම්මාන් පන්සල පාර, අංක 44/2 හි පදිංචි, සිවලිංගම් ඉලංකීරන් මහතා, යාපනය අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2012 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ 07.

02-501/2

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නෙරංජන් වික්‍රමසිංහ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48(1) යටතේ ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ආයතනය සංස්ථාගත කිරීමයි.

1. සැලසුම් තාක්ෂණ විද්‍යාව හා සැලසුම් ශිල්පය නගා සිටුවීම හා එයට ධෛර්යය දීම

2. සැලසුම් තාක්ෂණ විද්‍යාව භාවිතය සඳහා අවශ්‍ය හා අදාළ නීතිමය අංග අධ්‍යයනය, නගා සිටුවීම හා ඊට ධෛර්යය දීම

3. සාමාජිකත්වයේ විවිධ ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සොයා බැලීම.

යනාදිය වේ.

නෙරංජන් වික්‍රමසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

02-503

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.